**තම්පලාගම ප්‍රාදේශීය සභාව**

**-------------------------------**

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

**----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශ**

**--------------**

**1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම**

**-------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2015 ජූලි 06 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 පෙබරවාරි 17 දින ඉදිරිපත් කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 නොවැම්බර් 13 දින සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කරන ලදි.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට තම්පලාගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්**

**---------------------------------------**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම.**

**-------------------------------------------------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය මූල්‍ය ප්‍රකාශයන් සමඟ විගණනය සඳහා ඉදිරිපත් කළයුතු වුවත් එම ප්‍රකාශයන් ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**--------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශයන්හි හෙළිදරව් කර නොතිබුණි.

**1.3.3 ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණයන් විය.

(අ) සමාලෝචිත වර්ෂය තුල රු.144,450 ක පිරිවැයට මිලදීගන්නා ලද ජල පෙරන සහ ශබ්ද විකාශන යන්ත්‍ර ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණන ගාස්තු රු.15,000 ක් වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1984 සිට 2014 වර්ෂය දක්වා හිඟහිට තිබූ එකතුව රු.11,479,985 ක් වූ ආදායම් අයකර ගැනීම සඳහා කටයුතු නොකොට දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා තිබුණි.

(ආ) සේවකයෙකුට ගෙවන ලදුව 2012 වර්ෂයේ සිට හිඟහිට තිබූ කාර්ය මණ්ඩල ණය රු.33,291 ක් ඔහුගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකොට දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා තිබුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

----------------------------------------

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් සහ ගොඩනැගිලි | **83,217,856** | ස්ථාවර වත්කම් ලේඛනය සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| පිරියත් සහ යන්ත්‍ර සූත්‍ර | **1,654,460** | |
| මෝටර් වාහන සහ කරත්ත | **17,328,050** | |
| ආදායම් තැන්පතු | **1,276,855** | තැන්පතු ලේඛනය සහ කාල විශ්ලේෂණය |
| ටෙන්ඩර් තැන්පතු | **319,000** | |
| විවිධ තැන්පතු | **717,500** | |
| වෙනත් තැන්පතු | **3,863,160** | |

**1.3.6 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

----------------------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීමේ අවස්ථා විශ්ලේෂණය කර පහත දැක්වේ.

| | නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ - 134(1) වගන්තිය | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්නා නිශ්චල දේපල හඳුනාගෙන වටිනාකම තක්සේරු කොට වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති - 1988 | |

| | | | |
|---|---|---|---|
| (i) | I පරිච්ඡේදයේ 5(XII) වගන්තිය | - | මුදල්, ගබඩා සහ චෙක්පත් අත්සන් කිරීම පරිපාලනමය වශයෙන් නිලධාරීන් තිදෙනෙකුට පවරා තිබුණු නමුත් ඔවුන්ගෙන් ඇප ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) | III පරිච්ඡේදයේ 81 වගන්තිය | - | එක් එක් කාර්තුව අවසානයේදී ඉඩම් අයිතිය වෙනස්වීම පිළිබඳ මුද්දර ගාස්තු ආපසු ගෙවන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන්ද, වෙනත් ගනුදෙනු පිළිබඳ තීරු බදු ආපසු ගෙවන ලෙස මහා භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂවරයාගෙන්ද, දඩ මුදල් ආපසු ගෙවන ලෙස උසාවියේ රෙජිස්ට්‍රාර්වරයාගෙන්ද ඉල්ලීම් කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නැගෙනහිර පළාත් මූල්‍ය රීති (ප.මූ.රී) – 131.3 | - | මුදල් ලැබීම් සඳහා ලදුපත් නිකුත් කිරීමෙන් පසුව වගකිවයුතු නිලධාරීන් විසින් එම ලදුපත් උපපත්‍රිකා තමාභාරයේ ආරක්ෂිතව තබාගත යුතුය. එසේ වුවද රු.85,900 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ නිකුත් කරන ලද ලදුපත්වල උප පත්‍රිකා අස්ථාන ගතවී තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. |
| (ඈ) | අංක අයිඒඅයි/2002/02 සහ 2002 නොවැම්බර් 28 දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | - | පරිගණක උපාංග සහ පරිගණක මෘදුකාංග සටහන් කිරීම සඳහා වෙනම ලේඛනයක් පවත්වා නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම් ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.2,557,015 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා ආදායම් ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.1,747,974 ක් විය.

2.2 ආදායම් කළමනාකරණය
----------------------------

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය
---------------------------------------

සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| ----------------- | ------------------- | --------------- | ---------------------- |
| | රු. | රු. | රු. |
| වරිපනම් | 300,000 | 42,000 | 258,000 |
| කුලී | 6,447,115 | 2,084,574 | 4,362,541 |
| බලපත්‍ර ගාස්තු | 715,000 | 691,050 | 23,950 |
| වෙනත් ආදායම් | 395,000 | 2,270,755 | 1,875,755 |
| | 7,857,115 | 5,088,379 | 6,520,246 |

2.2.2 උසාවි දඩ

-----------

2008, 2009 සහ 2011 වර්ෂ සඳහා විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණය විසින් අය කරගන්නා ලද උසාවි දඩ පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයගෙන් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 විදුලි සංදේශ කුළුණු සඳහා ගාස්තු

-------------------------------------

2007 වර්ෂයේ සිට 2014 වර්ෂය අවසානය දක්වා සභා බල ප්‍රදේශය තුළ ස්ථාපනය කළ විදුලි සංදේශ කුළුණු 03 ක් සඳහා ගාස්තු අය නොකිරීම නිසා සභාවට වාර්ෂිකව රු.9,000 ක් වූ ආදායමක් අහිමි වී තිබුණි.

2.2.4 මුද්දර ගාස්තු

---------------

2014 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයවිය යුතු රු.819,974 ක් වූ මුද්දර ගාස්තු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

පුරනැගුම ව්‍යාපෘති අරමුදල් ප්‍රතිපාදනය යටතේ බුහාරි නගරයේ ක්‍රීඩා භූමිය අළුත්වැඩියා කිරීම සඳහා තාහා එච්.එම්.ඒ.ප්‍රජා මධ්‍යස්ථානය වෙත රු.4,950,024 ක් වටිනා කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද බිල්පත අනුව රු.3,345,139 ක් වූ වැඩ කොටස් සතුටුදායක ලෙස නිමකර ඇති බවට තාක්ෂන නිලධාරී විසින් නිර්දේශ කර තිබුණු නමුත්, කොන්ත්‍රාත්කරු විසින් වැඩ නිමකර නොතිබුණි.

(ii) පහත සඳහන් වැඩ කොටස් සඳහා ගෙවීම් කර තිබුණු නමුත් එම වැඩ නිමකර නොතිබුණි.

| | | රු. |
|---|---|---|
| | | --- |
| | ළමා උද්‍යානයේ තාප්පය සායම් ගෑම | 39,375 |
| | ක්‍රීඩා භූමියේ තාප්පය සායම් ගෑම | 112,500 |
| | ක්‍රීඩා භූමිය සඳහා ජල ටැංකිය | 40,000 |
| | | 191,875 |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රා දේශීය සභා පනතේ178 සහ 179 වගන්ති ප්‍රකාරව සභාවට ණය ලබාගැනීම සඳහා පළාත් පාලන අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත්, 2013 වර්ෂයේදී ණය පදනම මත රු.3,200,000 ක් පිරිවැය වූ ටිපර් රථයක් මිලදී ගැනීම සඳහා පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) 2014 ජූනි සිට දෙසැම්බර් දක්වා කියවන්නන්ට ලබාදුන් පුස්තකාල පොත් 87 ක් ආපසු ලබාගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඇ) කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ලබාගත් රු. 11,874,944ක් වූ ණය පියවීමට කටයුතු කර නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය
------------------------------------
2014 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලය සහ තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| කාර්ය මණ්ඩල වර්ගය | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්තය |
|---|---|---|---|---|
| විධායක | 01 | - | 01 | |
| සහායක | 18 | 14 | 04 | |
| සුළු සේවක | 27 | 23 | 04 | |
| වෙනත් | - | 17 | - | 17 |

කළමනාකරණ සේවයේ අධි ශ්‍රේණියේ තනතුරක්, කළමනාකරණ සේවයේ තනතුරු 04 ක් සහ සුළු සේවක තනතුරු 04 ක් පිළිවෙලින් ඉකුත් වර්ෂ 5 ක් වර්ෂ 3 ක් සහ වර්ෂ 3 ක් වූ කාලයක් තුළ පුරප්පාඩුව පැවති නමුත් එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ස්ථාවර වත්කම් පාලනය
(ඇ) තොග පාලනය
(ඈ) අත්තිකාරම් අයකර ගැනීම
(ඉ) ආදායම් රැස් කිරීම
(ඊ) ප්‍රසම්පාදන පරිපාටිය
(උ) ණය පාලනය